3 වන පිටෙන්

කාන්තාවකට නිදහස නොමැති බවද? ගැහැණුන්ට නිදහසේ ගමන් කිරීමේ අයිතිය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන්ම තහවුරු කර ඇත්තකි. එසේම මේ රටේ විදේශ විනිමය උපයන ප්‍රධාන ක්ෂේත්‍රයක් වන ඇඟලුම් කර්මාන්ත ශාලාවක වැඩ කළ චමිලා දිසානායක වෛද්‍යවරයෙකු විසින් දුෂණය කොට මරා දමා අවුරුදු හයක් ගෙවී ගොසිනි. මෙම නඩුව 2007 සිට තවමත් මීගමුව අධිකරණයේ ඇසෙන අතර වෛද්‍යවරයා ඇප පිට නිදහස්ව පෞද්ගලික වෛද්‍ය සේවයේ නිරතව සිටියි. පසුගිය 2013 ඔක්තෝබර් 17 දින යාපනයේ ලෝගරාණි සමුහ දුෂණයකට ලක් කොට ඇයගේ නිරුවත් සිරුර කෝවිලකට විසි කොට ගිය අතර ඇයගේ නග්න සිරුර රෙදි කඩකින් වැසීමට පවා කෙනෙක් ඉදිරිපත් වුයේ බොහෝ වේලා ගොසිනි. මේ අනුව සිතිය යුත්තේ ස්ත්‍රී දුෂණය වනාහි තනි කාන්තාවකගේ ප්‍රශ්නයක් නොව සමස්ත සමාජයටම බලපාන බරපතල ප්‍රශ්නයක් බවයි.

***මේ සා අපරාධ සිදු වෙද්දි තමාගේ පවුලේ කෙනෙකු දූෂණයට ලක් නොවි නැත්නම් ගැටලුවක් නැතැයි සිතමින් අපි බොහෝ දෙනා නෑසු කන්ව පාඩුවේ කල් ගෙවමු.***

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පාදක කර ගෙන ඇති වන්නා වු හිංසනයට කිසිම ආගමක්, ජාතියක්, වයසක්, දේශ සීමාවක්, ලිංග භේදයක් හෝ රටක් නැත. ගමක වුවද, නගරයක වුවද, සුදු වුවද, කලු වුවද, තරුණ වුවද, මහලු වුවද කම් නැත කිසිදු වෙනසක් නොතකා හිංසනය කාන්තාවට එරෙහිව ක්‍රියාත්මක වේ. ලොව සෑම තැනකම පාහේ පිරිමින් හා සසඳන කළ කාන්තාවන්ට එරෙහි හිංසනය ඉතා ඉහල අගයක් ගනී. එසේම ස්ත්‍රීන් දුෂණය කිරිම, පවුලේ සමිප ඥාතින් අතින් දැරියන් හට වන ලිංගික අතවර මෙන්ම බරපතල ලිංගික අපයෝජනය, පාසැල් තුළ හා මග තොටේ දී හා බස් රථ තුළ සිදු වන ලිංගික අතවර ඉතා අධිකව වාර්තා වේ. වාචිකව හෝ ශාරිරිකව කරන මෙකි අතවර අතරට කණට කුණුහරුප මිමිණුම, අශික්ෂිත විහිළු තහළුවලට ලක් කිරිම හා ලිංගික අවයව පෙන්වීම ආදිය ඇතුලත් වේ. මෙලෙස කාන්තාවන්ට එරෙහිව සමාජයේ බහුලව පැතිර ඇති ලිංගික අතවර හා හිංසන තුළින් කාන්තාවක් මනුෂ්‍යයෙකු වශයෙන් ලැබිය යුතු ගරුත්වය කෙලෙසා ඇයගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරයි. දියතලාව ඇල්ලගම ගමේ ඉරේෂා මලිති සත්සරණි අට හැවිරිදි දැරිය අගෝස්තු 18 වැනිදා තම පියාගේ 31 වියැති වැඩිමහල් මිතුරාගෙන් දුෂණයට ලක්ව මිය ගියාය. එය සිදුවුයේ මෙම කුඩා දැරිය දෙමව්පිය රැකවරණය නොමැතිව පිටස්තරයෙකු සමග තනිව පෙරහැරක් බැලිමට ත්‍රි රෝද රථයට නංවා යැවිම නිසාය.

මේ සා අපරාධ සිදු වෙද්දි තමාගේ පවුලේ කෙනෙකු දුෂණයට ලක් නොවි නැත්නම් ගැටලුවක් නැතැයි සිතමින් අපි බොහෝ දෙනා නෑසු කන්ව පාඩුවේ කල් ගෙවමු. මෙකී හිංසනය එළි පිට දවාලේ ද, ගේ දොර කවුලු පියන් අගුලු දා රහසිගතව ද කළ හැක්කේය. මේ වන විට ලේ ඥාතින්ගෙන් ගැහැණු දරුවන්ට එරෙහිව සිදු වන ස්ත්‍රී දුෂණ හා ව්‍යාභිචාරි වැරදි වැඩිවෙමින් පවති. උදාහරණයක් ලෙස ළමාරක්ෂණ අධිකාරියේ වාර්තාවකට අනුව 2011 දී ලිංගික අතවරයන්ට අදාල සිද්ධි 1463ක් ද ළමා අපයෝජන සිද්ධින් 2000ක් ද 2012 වන විට ලිංගික අතවර සිද්ධින් 1759ක් ද ළමා අපයෝජන සිද්ධින් 5473 ක් ද වාර්තා විය. වර්තමානයේ ස්ත්‍රී දූෂණ වලින් 89% ක්ම දැරියන්ට එරෙහිව සිදු වු හිංසනයන්ය( මව්බිම 2013 ඔක්තෝබර් 02). කාන්තා අයිතින් හා ළමා රැකවරණය ගැන සපථ දී ඇති රජයක් මෙකි හිංසන වැලැක්වීමට වහා පියවර ගත යුතුය. එසේම රජයේ ආයතන හා වගකිවයුතු නිළධාරින් වරදකරුගේ තරාතිරම නොබලා



නීතිය අකුරට ක්‍රියාත්මක කළ යුතුය. මනුෂ්‍යයකු වශයෙන් උපත ලබන සැම තැනැත්තෙකුටම කායික හා මානසික අංශවලින් පූර්ණ නිරෝගීබව වැදගත් වන අතර සෑම කෙනෙකුටම තමාගේ ශරිරයට අයිතියක් ඇතිව මානසික සුවයකින් ජීවත් වීමේ අයිතියක් තිබේ. නමුත් කාන්තාවක් මනුෂ්‍යයෙකු බව අමතක කරමින් කාන්තාවන්ට එරෙහි හිංසනය සෑම තැනම ක්‍රියාත්මක වේ. මෙකී හිංසන කාන්තාවක් මනුෂ්‍යයෙකු වශයෙන් ලැබිය යුතු ගරුත්වය කෙලෙසා ඇය අසරණියක් බවට පත් කරයි. ශ්‍රී ලංකාව තුළ අසන්නට දකින්නට ලැබෙන ස්ත්‍රී දූෂණ, ළමා අපචාර හා ලිංගික අතවරවලට තිත තැබිය යුතුය. කාන්තා නිදහස සුරුකි සමාජයක කාන්තාවන්ට වැඩ පොළේ දී, මග තොටේ දී, නිවසේ දී හා වෙනත් ඕනෑම තැනක දී ස්වකිය සුරක්ෂිතතාව තහවුරු විය යුතුය.

එසේම ලිංගික වෘත්තියේ යෙදවීම සඳහා කුට්ටනය හා කාන්තා ශරිර ජාවාරම් කිරිම කාන්තාවන්ට එරෙහිව සිදු වන බලවත් අපරාධයකි. එසේම කාන්තාවන්ට එරෙහි හිංසනය, කුට්ටනය, ලිංගික අතවර හරහා කාන්තාවන් එච්. අයි. වී ඒඩ්ස් උවදුරට ගොදුරු වීමේ ප්‍රවණතාවය මේ වන විට වැඩිවෙමින් පවති. කාන්තාවන් පෙළන කායික හා මානසික හිංසන ක්‍රියාවන් හා ඇය කාන්තාවක් වීම නිසාම විඳින්නට සිදු වන ගැහැටවලින් අත්මිදී ස්වකිය සමාජමය වැඩ කටයුතු කිරිමට හැකි වන්නේ නම් එය රටක ගැහැණුන් ලබන නිදහස වෙයි. මේ නිසා මානව නිදහස හා පුද්ගලික ආත්ම ගෞරවය රැක දෙන හිංසනයෙන් තොර රටක් ඇති කිරිමට සියල්ලන්ම උත්සුක නොවුවහොත් සිදුවන විනාශය අති දරුණු විය හැකිය. මන්ද රටක කාන්තාවන් හා දරුවන්ගේ ආරාක්ෂාව නොසලකන රාජ්‍යය පිරිහි යන්නේය. මෙය එදා බුදුන් ලිච්ජවි රජදරුවන්ට කියා දුන් පාඩමයි.

boondi.lk

## සන්නස Cartoon by PK





## සන්නස නව ගිණුම් අංකය

වෙළඳ දැන්වීම් සඳහා ගෙවීම් පහත දැක්වෙන සන්නස නව ගිණුමට ගෙවන මෙන් ඉල්ලා සිටිමු

Account Name - Sannasa Media
Bank - Commonwealth Bank
BSB Number - 3619
Account Number - 10852429

**සන්නස මීඩියා Sannasa Media**

**සියලුම ජෝතිශ්‍ය කටයුතු**

දෙස් විදෙස් ජේන්ද සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සිහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මගහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දළ. සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au